// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1582/36 - 2009 ජනවාරි 01 වැනි බ්‍රහස්පතින්දා - 2009.01.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. -බී. 3/92 II.

### 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 34 වැනි වගන්තිය සමග කියවිය යුතු 64 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

පාඨලී චම්පික රණවක,
පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍ය.

2009 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1993 නොවැම්බර් මස 26 වැනි දින අංක 794/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව වරින් වර සංශෝධිත පරිදි වූ 1993 අංක 1 දරන පතල් කැනීම් (බලපත්‍ර දීමේ ) නියෝග එහි 33 වන නියෝගයේ (4) වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (4) විකුණුම්වලින් හෝ පතල් නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳ නිශ්චය කරන ලද වෙළඳ වටිනාකම අනුව හෝ අය කරන රාජ්‍ය භාග, ඛණිජ ද්‍රව්‍ය ආයෝජන ගිවිසුමෙහි අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් මිස, එම වටිනාකම්වලින් පහත දැක්වෙන ප්‍රතිශතයක් විය යුතු ය :—

| | | |
|---|---|---|
| අඝනා ලෝහ වර්ග | | සියයට 5 |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයන නොකරන ) | - | සියයට 4 |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනික ) | - | සියයට 5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | - | සියයට 2 |
| ගල් (අපනයනික පාෂාණ ) | - | සියයට 5 |
| පදනම් ලෝහ සහ වෙනත් ලෝහ | - | සියයට 4''. |

01-481

1A - G 010622 — 930 (2009/1) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.